# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2119/16 – 2019 අප්‍රේල් 18 වැනි බ්‍රහස්පතින්දා – 2019.04.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: අයිආර්/සීඕඑම්/03/2018/18.

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරිය**

131 වන අධිකාරිය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ 2018.10.23 දිනැති හා අංක 2094/28 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2018.10.11 වැනි දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් බුලත්කොහුපිටිය, අලවතුර, කෑගල්ල පාර හි පදිංචි පී. එල්. කේ. ජී. ගුණවර්ධන මයා හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 05, කිරුළ පාර, අංක 200 හි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2019.03.26 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019 අප්‍රේල් මස 04 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

1A – G 29902 – 13 (2019/04)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

*යොමු අංකය: අයිආර්/සීඕඑම්/03/2018/18.*

**කාර්මික අධිකරණයේ දී ය.**

පී. එල්. කේ. ජී. ගුණවර්ධන මයා, කැගල්ල පාර, අලවතුර, බුලත්කොහුපිටිය.

*ඉල්ලුම්කරු*

*සහ*

*නඩු අංකය: ඒ/72/2018*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

*වගඋත්තරකරු*

**ප්‍රදානය**

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධන මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් කළුතර, නාගොඩ, ශ්‍රී සෝභිත මාවත, අංක 242, ඕබඩගේ ලීලාරත්න වන මා 2018.10.11 වැනි දින පත්කොට මෙම ආරාවුල මා වෙත යොමුකර ඇත.

ඉහත සඳහන් පාර්ශවයන් අතර පවත්නා කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ ''විදේශ ගතවීම සඳහා 2011.12.22 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි නිවාඩු ඉල්ලීමක් සිදුකර විදේශ ගත වී ඇති, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අවිස්සාවේල්ල ඩිපෝවේ රියදුරකු වන පී. එල්. කේ. ජී. ගුණවර්ධන මහතාට, විදේශගතව සිට ආපසු පැමිණි පසු නැවත සේවය කිරීමට අවස්ථාව ලබා නොදීම තුළින් යම් අසාධාරණයක් සිදුවී තිබේද? එසේ අසාධාරණයක් සිදුවී ඇත්නම් ලැබිය යුතු සහන මොනවාද යන්න පිළිබඳව වේ.

ඒ අනුව පාර්ශවයන් අතර පවත්නා කාර්මික ආරාවුල සම්බන්ධයෙන් දෙපාර්ශවය වෙතින්ම ලිඛිත කරුණු දැක්වීමෙන් අනතුරුව නඩුව විභාගයට ගැනීමට තීරණය කරන ලදී. ඒ අනුව නඩුව කැඳවූ ප්‍රථම දිනයේ දී ම වගඋත්තරකාර පාර්ශවය විසින් සමථ යෝජනාවක් ඉදිරිපත් කරන ලදී. එනම් සේවයේ බණ්ඩනයකින් තොර පසු වේතන රහිතව නැවත සේවයේ පුනපත් කිරීමට කළමණාකාරීත්වයේ අනුමැතිය ලබාගෙන, සලකා බැලීමේ හැකියාවක් ඇති බවට ප්‍රකාශ කරන ලදී. ඉල්ලුම්කාර පාර්ශවය විසින් මෙම සමථ යෝජනාවට තම එකඟත්වය ප්‍රකාශ කරන ලද අතර, ඊළඟ දිනයේ දී එනම් 2019.03.12 දිනයේ දී මෙම සමථය අනුව කටයුතු කළ හැකි ද යන්න කළමණාකාරීත්වයෙන් විමසා සමථ යෝජනාව ක්‍රියාත්මක කළ හැකි ද? නොහැකි ද? යන්න දන්වන බව පවසා සිටින ලදී.

ඒ අනුව 2019.03.12 දින වගඋත්තරකාර ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය වෙනුවෙන් ආයතනයේ නීති නිලධාරිණී මොනිකා රත්නායක මහත්මිය ප්‍රකාශ කර සිටියේ මෙම ආරාවුලේ ඉල්ලුම්කරු විසින් පූර්ව නිවාඩු අනුමත කර ගැනීමකින් තොරව විදේශ ගත වී ඇති බැවින් මොහුගේ සේවය අවසන් කළ යුතු වුවද, එවකට අවිස්සාවේල්ල ඩිපෝ කළමණාකාර තැන විසින් ඉල්ලුම්කරුගේ සේවය අවසන් කර නොමැති බැවින් මෙවැනි වරදක් කරන වෙනත් සේවකයෙකු හට පූර්වාදර්ශයක් නොවන ආකාරයෙන් මෙම නඩුව සමථයක් ලෙස ඉල්ලුම්කරුගේ එකඟතාවය මත පසු පඩි රහිතව දෙවන පෙළ රියැදුරෙකු වශයෙන් දුරු තනතුරේම 2019.04.01 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි සේවය බණ්ඩනයකින් තොරව ප්‍රතිෂ්ඨාපනය කිරීමට ශ්‍රී ලංගම සභාපතිතුමා විසින් අනුමැතිය ලබා දී ඇති බව ද සැළ කර සිටින ලදී.

ඒ අනුව ඉල්ලුම්කරු වෙනුවෙන් නියෝජිත ශ්‍රේෂන් සිල්වා මහතා පවසා සිටියේ ඉල්ලුම්කරු නිවාඩු ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කොට ගියත් එය අනුමත වූවා ද, නැද්ද යන්න පසු විපරම් කර නැති බවත්, කෙසේ වුව ද වගඋත්තරකාර පාර්ශවයේ සමථ යෝජනාවට ඉල්ලුම්කරු එකඟ වන අතර, සේවා බණ්ඩනයකින් තොරව අවිස්සාවේල්ල ඩිපෝවේ වෘත්තීය රියැදුරෙකු වශයෙන් අඛණ්ඩ සේවය භාර ගැනීමට එකඟ වන බැව් සැළ කර සිටින ලද අතර, ඒ අනුව 2019.04.01 දින සේවයට වාර්තා කිරීමට ඉල්ලුම්කරු එකඟ බවයි.

වගඋත්තරකාර පාර්ශවය වෙනුවෙන් කියා සිටියේ අවිස්සාවේල්ල ඩිපෝවේ සේවය සඳහා අනුයුක්ත කළ හැකි ද යන්න ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ මානව සම්පත් කළමණාකාරතුමා විසින් තීරණය කරන්නක් බැවින්, ඒ සඳහා ඉල්ලීමක් කර සළකා බැලිය හැකි බවයි. එතෙක් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අනුයුක්ත කරන බව ද කියා සිටී.

අවිස්සාවේල්ල ඩිපෝවේ පුරප්පාඩුවක් පවතින්නේ නම් පමණක් එම ඩිපෝවට පත් කිරීම සළකා බැලීමට හැකි බවට ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ නීති නිලධාරිණී මොනිකා රත්නායක මහත්මියගේ කරුණු දැක්වීමට ඉල්ලුම්කාර පාර්ශවයද එකඟතාවය පළ කරන ලදී.

ඒ අනුව ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින් ඉදිරිපත් කරන ලද සමථ යෝජනාව ඉල්ලුම්කාර පාර්ශවය විසින් පිළිගන්නා ලද බැවින් නඩුව අවසන් කරන ලදී. ඒ අනුව 2019.04.01 වැනි දින සිට ඉල්ලුම්කරු, සේවය බණ්ඩනය වීමකින් තොරව පසු වැටුප් රහිතව ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අනුයුක්තව දෙවන පෙළ රියැදුරෙකු වශයෙන් සේවයේ පිහිටුවිය යුතුය යන්න බේරුම්කාර ප්‍රදානය විය.

මෙම සමථය සාධාරණ වූත්, යුක්ති සහගත වූත් එකක් බවට තීරණය කරමි.

ඕබඩගේ ලීලාරත්න,
බේරුම්කරු.

2019 මාර්තු මස 26 වැනි දින දී ය.

05 – 40

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.